VIDUS 19-2-3

# මහාචාර්ය කෝදගොඩ සහ නරේසා ආයතනය

මහාචාර්ය ප්‍රියානි ඊ සොයිසා
සභාපති
ජාතික විද්‍යා පදනම

නන්දදස කෝදගොඩ මහාචාර්ය තුමන් හා මාත් අතර කොළඹ වෛද්‍ය පීඨය තුළදී ගොඩනැගුණු සුහදශීලී මිත්‍රත්වය දශක දෙකහමාරක අධ්‍යයන කාල අතීතයකට හිමිකම් කියයි. එවකට ඔහු කොළඹ වෛද්‍ය පීඨයේ ව්‍යෝහාරික වෛද්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙක් විය. ප්‍රේමදස උඩුගම මහතාගේ ඇරයුමකට අනුව අප විසින් පෙර පාසැල් දරුවන් යන ග්‍රන්ථය රචනා කරන ලද්දේ එම විෂය ක්‍ෂෙත්‍රය පිළිබඳ මට තිබුණු විශේෂඥ දැනුම මෙන්ම නන්දදස කෝදගොඩ මහාචාර්යතුමාගේ සිංහල භාෂාව පිළිබඳව තිබුණු නිපුණත්වය නිසාය.

වසර 1992 දී එවකට කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳව ගරු ඇමතිව සිටි රනිල් වික්‍රමසිංහ මහතා විසින් අනෙකුත් සාමාජිකයන් සමග පත් කරන ලද ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරියේ (නරේසා) පාලක මණ්ඩලයේ පාලක සභා තුනක මෙතුමා සේවය කරන ලදී. එතැන් පටන් වසර 1992 සිට විද්‍යා අධ්‍යාපන ක්‍රියාකාරී කමිටුවේ සභාපති ලෙසද කටයුතු කලේය. නරේසා ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ සභාපති ලෙස මා කටයුතු කළ අවධියේ දී එතුමා සතුව තිබුණු කාර්ය ශක්තිය හැකි උපරිම අන්දමින් මා හට ලබාදීමට පසුබට වූයේ නැත. පසුව වසර 1994 දී ගරු බර්නාඩ් සොයිසා අමාත්‍යතුමා වශයෙන් විද්‍යා හා තාක්ෂණික අමාත්‍යාංශයට කැබිනට් නිලයක් ලබාදුන් අවස්ථාවේදී නැවත වරක් එතුමාව පාලක සභාවට පත් කෙරිණි. වසර 1997 දීත් ගරු බර්නාඩ් සොයිසා අමාත්‍යතුමා විසින් නැවත වරක් කෝදගොඩ මහාචාර්ය තුමාව නරේසා පාලක මණ්ඩලයට පත්කර ගනු ලැබීමෙන් පසුව මිය යන තුරුම ඔහු අප ආයතනයට පාලක සභාවේ සාමාජිකයෙකු වශයෙන් වටිනා සේවයක් සලසා දුන්නේය. එහි කටයුතු සඳහා මහාචාර්ය කෝදගොඩගේ දයකත්වය සත්‍ය වශයෙන්ම ආලෝකයක් විය. එසේ වූයේ පරිපාලකයෙකු ලෙස කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ව්‍යෝහාරික වෛද්‍ය විද්‍යා අංශයේ ප්‍රධානියා ලෙසත්, වෛද්‍ය පීඨයේ පීඨාධිපති මෙන්ම උප කුලපති ලෙසත් කටයුතු කිරීමෙන් ලබාගත් ඔහුටම ආවේනික වූ විද්‍යාත්මක පසුබිම සහ අත්දැකීම් නිසාය. ඔහු සතුව තිබුණු අනෙක් පලපුරුදු වූයේ රාජ්‍ය නොවන සංවිධාන සමග සේවය කිරීමයි. මේ සියලු ගුණාංගයන් හා අත්දැකීම් පාලක මණ්ඩලය තුළ එතුමාව සුවිශේෂ පුද්ගලයෙකු කලේය. බඳවා ගැනීම්, 1994 දී නරේසා ආයතනය "ජාතික විද්‍යා පදනම" ලෙස වෙනස් කළ යුතුයයි සලකා බැලූ කාලයේදීත් උසස්වීම් සහ වැටුප් පුණරීක්ෂණ වැනි බොහෝ උපකමිටු වලදී ප්‍රථමයෙන් ඔහු ක්‍රියාකාරීව සිටි අතර කාර්ය මණ්ඩල වෙනස් කිරීම හා පත්වීම් ශ්‍රේණිගත කිරීම වැනි දේ ඔහු ගේ සැලකිල්ලට භාජනය විය. අනෙකුත් උපකමිටු වලදීත් ඉතා උනන්දුවෙන් හා කැමැත්තෙන් කටයුතු කළ අතර ඔහුට තිබුණ නීතිය පිළිබඳ දැනුම නිසා සෝදිසි නිලධාරියෙකුද විය. පරිපාලන හැකියාවන්ට අමතරව ඔහුගේ තීන්දු සත්‍යවශයෙන්ම ප්‍රඥාවන්ත වූ අතර ඔහු ඉදිරිපත් කළ නම්‍යවූ සාධාරණ මානුෂික තීන්දු සාම්ප්‍රදයික නිලධාරී පරිපාලනයට ආදර්ශයක් විය.

පරිපාලන හැකියාවන්ට අමතරව ඔහුගේ තීන්දු සත්‍ය වශයෙන්ම ප්‍රඥාවන්ත වූ අතර ඔහු ඉදිරිපත් කළ නම්‍යවූ සාධාරණ මානුෂික තීන්දු සාම්ප්‍රදයික නිලධාරී පරිපාලනයට ආදර්ශයක් විය.

හිටපු විද්‍යා හා තාක්ෂණ ඇමති බර්නාඩ් සොයිසා මහතාට ඉදිරිපත් කළ විද්‍යා හා තාක්ෂණික කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී සැළැස්ම මුදුන් පමුණුවා ගැනීමේදී

පාලක මණ්ඩල කටයුතු වලට එතුමා ප්‍රබෝධමත් සම්පතක් විය. අතිගරු ජනාධිපතිනිය මෙය අනුමත කළ අවස්ථාවේදිද ඔහු අප අතර විය. අතිගරු ජනාධිපතිනියගේ ඉල්ලීමට අනුව මහජනයා අතර මෙම සැලැස්ම ජනප්‍රිය කරවීමේ අවශ්‍යතාවට දිවංගත ගරු බර්නාඩ් සොයිසා ඇමතිතුමා එකඟ විය. ඒ සඳහා සිංහලෙන් පිටපතක් සකස් කළත් අවාසනාවකට මෙන් එහි අවසන් ඡේදය ලියා නිම කිරීමටත් පෙර කෝදගොඩ මහාචාර්යතුමා දැඩි ලෙස රෝගාතුර විය. එතුමාගේ වියෝවෙන් දුකට පත් පවුල වෙනුවෙන් ශෝක පණිවිඩයක් යැවීම් වස් නරේසා ආයතනයේ පාලක මණ්ඩලය මෙවැනි සමරු කලාපයක් එතුමා වෙනුවෙන් පළ කිරීමේ අවශ්‍යතාවය මතු කළ අතර විද්‍යා අධ්‍යාපන කමිටුවට එම කටයුත්ත බාරදෙන ලදි. එතුමා නරේසා ආයතනයෙන් පිටතදී සිය දැනුම හා පළපුරුද්ද දයක කළ ආකාරය ඒ ඒ ලිපිවල කතුවරුන් විසින් යෝග්‍ය වන පරිදි දක්වා ඇති අතර මෙම ලිපියෙහි තිබෙන අඩුපාඩු එම ලිපි වලින් පිරිමැසේ. ජීවිතයෙන් අත්මිදුණු ඔහු, සාමයෙන් හා තෘප්තියෙන් යුතුව නිර්වාණය දක්වා ඉදිරියට යාම අපගේ ප්‍රාර්ථනයයි.



සංගීතය පිළිබඳව හසළ දැනුමක් තිබුණු එතුමා පරිහරණය කළ සර්පිනාව සහ වයලීනය



විශ්ව ප්‍රසාදිනී සම්මානය